# චීවරයේ වර්ණභේදය සහ විනයනීති පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය ඇසුරිනි.)

පූජ්‍ය, වෙලම්පැලේ රතනසාර හිමි[1]

## හැඳින්වීම

බෞද්ධ සඞ්ඝශාසනය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් පසු බෞද්ධ භික්ෂුවගේ අනන්‍යතාව හැඳින්වෙන නිල ඇඳුම චීවරය (චීවරං) නමින් සූත්‍ර දේශනාවන්හි හඳුන්වා තිබේ. පැවිදි බවට පත් කිරීමේ දී එය 'කාසාව' නාමයෙන් හඳුන්වා ඇත. සිව්පස පරිභෝජනයේ මූලිකත්වය ලැබෙන්නේ චීවරයට යි. චීවරය සකස් කර ගැනීම හා එය නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ බුදුරදුන් විශේෂ අවධානයක් යොමු කරමින් විනය නීති දේශනා කර තිබේ. වැරදි අරමුණු යටතේ චීවර භාවිතය තණ්හාව, මානය, සක්කායදිට්ඨිය යන කෙලෙස් වර්ධනයට හේතු වේ. චීවරය පිළිබඳ විනයනීති සකස් වීම එකවර සිදු වූවක් නො වේ. භික්ෂු ආකල්පයන්ට ගැළපෙන පරිදි එය ක්‍රමික විකාශනයක් මත සිදු වූවකි. මෙම පර්යේෂණයේ අවධානය යොමු වන්නේ චීවරයේ පැහැය පිළිබඳ ව යි. ඒ අනුව චීවරයේ පැහැය සකස් කර ගැනීමට බුදුරදුන් විනයනීති පැනවීම් සිදු කර තිබේ. එය සිදු කර ඇත්තේ භික්ෂු අරමුණු සාධනයට අවකාශ ලැබෙන පරිද්දෙනි.

## පර්යේෂණ අරමුණ

චීවරයේ වර්ණභේදය පිළිබඳ විනයනීති මඟින් ප්‍රකට වන බුදුරදුන්ගේ ආකල්පය විමර්ශනය කරමින් එහි වත්මන් භාවිතය පිළිබඳ විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය.

## පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. විනයපිටකයේ චීවරක්ඛන්ධකය ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ද පර්යේෂණ මාතෘකාවට අදාළ ප්‍රාමාණික විද්වතුන් විසින් රචිත ද්විතීයික මූලාශ්‍රය මඟින් තොරතුරු අධ්‍යයනය ද සිදු විය. එසේ ම ලාංකීය භික්ෂුශාසනය තුළ පවතින විවිධ නිකායයන්, සම්ප්‍රදායයන් අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය උපයෝගී කරගන්නා ලදී.

## පර්යේෂණ ගැටලුව

ලාංකීය භික්ෂු සමාජයේ භාවිත චීවරවර්ණ විනයනීති සමඟ දක්වන අනුකූලත්වය කෙබඳු ද?

[1]. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය රුහුණ විශ්වවිද්‍යාලය. *wrthero.wr1996@gmail.com*

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

චීවරය බෞද්ධ භික්ෂුව සඳහා නිර්දේශිත නිල ඇඳුම වශයෙන් සැලකිය හැකි ය. සත්වයාගේ ඇඳුම් සම්බන්ධ මූලික අවශ්‍යතා පූර්ණය කර ගැනීම එහි ප්‍රධාන අපේක්ෂාව වුව ද චීවරය කෙලෙස් වර්ධනය කිරීමට නො ව පාලනයට උපයෝගී වන අයුරින් භාවිත කිරීම සුවිශේෂී ලක්ෂණයකි. ප්‍රත්‍යවේක්ෂා පාඨයට අනුව චීවරය භාවිතයේ අරමුණු කිහිපයක් සඳහන් වේ.

**"පටිසඞ්ඛායොනිසො චීවරං පටිසෙවාමි. යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්‍ථං"**

1. ශීත දුරු කර ගැනීම,
2. උෂ්ණය නැති කර ගැනීම,
3. මැසිමදුරුවන්ගෙන් ආරක්ෂා වීම,
4. සුළඟින් අව්වෙන් ආරක්ෂා වීම,
5. පත්තෑ ගෝනුසු ආදී සතුන්ගෙන් වන පීඩා වළකා ගැනීම,
6. නො වැසුවහොත් ලැජ්ජාව ඇතිවන ශරීරාවයව වසා ගැනීම, වශයෙන් එම අරමුණු දැක් වේ.

**චීවරයේ වර්ණය**

බුදුසසුනේ මුල් අවධියේ භික්ෂූන් පාංසුකූලික චීවර පරිහරණය කර තිබේ. පසුව ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම අනුව ගෘහපති චීවරය අනුදැනීම සමග චීවරය සම්බන්ධ විනයනීති පැනවීම් ආරම්භ විය. චීවරය සම්බන්ධ පැනවීම් මහාවග්ගපාළියේ චීවරක්ඛන්ධකයේ අන්තර්ගත වේ.

බුදුරදුන් ජීවමාන සමයේ භික්ෂූන් ගොම හා රතු මැටි දියකර සිවුරුවලට පඬු පොවා ඇත. එයින් සිවුරු දුර්වර්ණ සහ දුර්ගන්ධයට පත්ව තිබේ. එහි දී බුදුරදුන් විනයනීතියක් පනවමින් සයාකාර වූ පඬු භාවිතයකට උපදෙස් ලබා දීමක් සිදු කර ඇති බව මෙසේ සඳහන් වේ.

**"අනුජානාමි භික්ඛවෙ ඡරජනානි; මූලරජනං, ඛන්ධරජනං, තචරජනං, පත්තරජනං, පුප්ඵරජනං, ඵලරජනන්ති."**

එයට අනුව මුල් පඬු, දඬු පඬු, පොතු පඬු, කොළ පඬු, මල් පඬු, ඵල පඬු යන පඬු වර්ග භාවිත කිරීමට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව සියල්ල නිල් වන් වූ, රන්වන් වූ, රතු වූ, මඳටිය වන් වූ, කළු වූ, පත්තෑයන්ගේ පිටේ පැහැ ඇති, ඉදුණු කොළවල පැහැ ඇති චීවරයන් භාවිත කිරීම නො කළ යුතු බව දක්වා තිබේ.

**"න භික්ඛවෙ සබ්බනීලකානී චීවරානි ධාරෙතබ්බානි, න සබ්බපීතකානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බලොහිතකානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බමඤ්ජිට්ඨකානි චීවරානි ධාරෙතබ්බානි, න**

**සබ්බකණ්හානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බමහාරඞ්ගරත්තානි චීවරානි ධාරෙතබ්බානි, න සබ්බමහානාමරත්තානි චීවරානි ධාරෙතබ්බානි."**

**පර්යේෂණ සාකච්ඡාව**

**ලාංකික භික්ෂුව සහ චීවරයේ වර්ණභේදය**

පෘතුගීසි පාලන සමයේ ඇති වූ ශාසනික පරිහානිය යටතේ ලාංකීය භික්ෂු සමාජයේ උපසම්පදා ක්‍රමය අභාවයට ගියේ ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ සරණඞ්කර හිමියන්ගේ උත්සාහයෙන් උපසම්පදාව පිහිටුවීම සිදු විය. පසුව රජු විසින් සඞ්ඝයා හා ජනයා මධ්‍යයේ සම්මත කළ කතිකාවත මඟින් ඇති වූ අර්බුදය සඞ්ඝ සමාජයේ නිකායභේදය ඇතිවීමට හේතු විය. පහත දැක්වෙන්නේ එම කතිකාවත යි.

**"සඟ රජ හා දෙවෙහෙර ගණනායක දෙනම ඇතුළු බොහෝ සඞ්ඝයාත් මහ නිලමේ ඇතුළු වැසියෝත් දළදා මාළිගාවට රැස් කරවා වදාළ පණත.**

**එහෙයින් බුද්ධාඥාව මුල් කොට රාජාඥාව පනවමින් අනුන් මෙහෙ කරන නිසුකම් රැදුකම් කරන ජනයින්ට ද උන්ගේ පැටවුන්ට ද හීන කුලගොත් ඇතියන්ට ද මෙකල බුදු සසුනෙහි පැවිදි නො ම දෙනු.**

**උතුම් කුලගොත් දරණ සතුන් කරුණා ඇති බැතින් පිං කරණ පිනෙන් නො අඩු ලකුණු ඇති අධික රුදුමානය නැති නිහතමානය ඇති මෙලක වැසි ගොවි දනන් පමණක් ගෙන පැවිදි දෙනු පස්වාදහසක් පවතින ලක්දිව ශාසනය ඇති තෙක් ම උභය විහාරය මේ මහ අණ අකඩ නො කර වඩමින් ශාසන පිළිවෙත් පවිත්‍රව රැකගත යුතුම ය.**

**සසුනෙහි පැහැද පැවිදි බව ලබා සිටින හීනකුලගොත් දරණ තැන් ගැන කෙසේ කටයුතු ද කියා සඟරජ්ජුරුවෝ වදාළ ප්‍රස්තාවනාවට ඒ තැන් උපසම්පදා නො කළ යුතු ය කියා මහ අණ ලැබුනා ය."**

උපසම්පදාව ලබා ගැනීම හා පිරිසිදු උපසම්පදාවක් ලැබීම යනු අරමුණු මූලික කරගෙන බුරුමයේ අමරපුරයෙන් හා රාමඤ්ඤ දේශයෙන් උපසම්පදාව ලැබූ ලාංකීය භික්ෂූන් එම උපසම්පදා ක්‍රමයන් ලංකාවේ ක්‍රියාත්මක කළේ ය. එයින් ලාංකීය භික්ෂු සමාජය ප්‍රධාන නිකායත්‍රයකට බෙදුණි. එම නිකායන් උපසම්පදාව ගෙනා ප්‍රදේශවල භික්ෂූන් භාවිත කළ චීවර පැහැයන් එලෙසින් ම භාවිත කළ නිසා නිකායට අනුකූල පැහැයන් ලෙස එම වර්ණභේදය ලක්දිව සමාජගත වීම සිදු විය.

1. සියම් නිකාය - කහ පැහැය
2. අමරපුර නිකාය - දම් පැහැය
3. රාමඤ්ඤ නිකාය - මඳටිය පැහැය

**පර්යේෂණ සමාලෝචනය**

මේ අනුව ලක්දිව භික්ෂූන් වහන්සේගේ චීවර වර්ණභේදය විවිධ රටවලින් ගෙන ආ උපසම්පදාව අනුව විවිධත්වයට පත් ව ඇත. එහෙත් වර්තමානයේ පවා ඇතැම් භික්ෂූන් වහන්සේ විනයනීතිවලට අනුගත ව

පඬු පෙවීමෙන් චීවරයේ වර්ණය සකස් කර ගනිති. බුදුරඳුන් විසින් ප්‍රතික්‍ෂේපිත වර්ණ වර්තමාන භික්‍ෂු ශාසනය තුළ චීවරය සඳහා යොදා ගැනීමේ ප්‍රවණතාවක් ද දැකගත හැකි ය. ථෙරවාදීන් ප්‍රථම සඞ්ගිතියේ දී විනයනිතී එලෙසින් සුරැකීමට තබාගත් සම්මුතිය බණ්ඩනය වීමක් එමඟින් සිදු වන අයුරු ප්‍රායෝගික ව ලාංකීය භික්‍ෂු සමාජයේ දක්නට ලැබේ. එසේ ම භික්‍ෂු චීවරයට ගැළපෙන විවිධ වර්ණ යොදා ගැනීමට විනයනීති මඟින් අවහිරතාවක් නොමැති බව මෙහි දී තහවුරු විය.

**ප්‍රමුඛ පදඃ** චීවරය, භික්‍ෂුව, වර්ණය, විනය

**මූලාශ්‍රය**


- **මහාවග්ගපාළි** 2. චීවරක්ඛන්ධකය. (2005). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර් මුද්‍රණය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- චන්‍දවිමල හිමි, ආර්. (2013). **ශාසනාවතරණය.** පොකුණුවිටඃ ශ්‍රී චන්‍දවිමල ධර්මපුස්තක සංරක්‍ෂණ මණ්ඩලය.
- ධර්මකීර්ති හිමි, එන්. (1996). **ශ්‍රී ලංකාවේ 2500 වසරක සඞ්ක්ෂිප්ත ශාසනික ඉතිහාසය.** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.